# වෙරිටේ විදසුන්

ජූලි 2021

09 වැනි වෙළුම
04 වැනි කාණ්ඩය



VERITÉ RESEARCH
Strategic Analysis for Asia

වෙරිටේ රිසර්ච් යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජනමාධ්‍යය විෂයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.



**සල්මා රසීක්**
*පර්යේෂකය*

**නිශාන් ද මෙල්**
*විදසුන් මාලා සංස්කාරක*


**රු. 100 ක්**

දත්ත කිලෝබයිට් 50 ක් සඳහා අය කරන ලදී

**රු. 427,406 ක්**

2012 සංගණන දත්තවලින් 5% ක නියැදියක් සඳහා අය කරන ලදී

**වර්ෂ 1.5 ක්**

දත්ත ගොනුවක් ලබා ගැනීම සඳහා ගත විය



Image courtesy of Unsplash

# පොදු දත්ත පොදු කිරීම: ශ්‍රී ලංකාව සිය ඉලක්කය වෙත යාමට අසමත් වෙද්දී ඉන්දියාව එය අභිබවා යයි

සංඛ්‍යාන තොරතුරු නිසි කලකට උත්පාදනය කිරීම හා ලබා දීම අතින් 'කලාපීය පුරෝගාමියා' බවට පත් වීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අරමුණ වේ. මෙම විදසුන පෙන්වා දෙන්නේ ජනතාවට දත්ත ලබා ගැනීමට ඇති පහසුව, ඉක්මණ සහ පිරිවැය අතින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සිය දැක්ම සාක්ෂාත් කර ගැනීමට අසමත් වී ඇති බවයි. එහෙත්, පහසුව, ඉක්මණ සහ පිරිවැය අතින් ශ්‍රී ලංකාව අභිබවා යමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්මට අනුව ශ්‍රී ලංකාව අත්කර ගැනීමට ප්‍රයත්න දරන කලාපිය පුරෝගාමියාගේ තත්වයට ඉන්දියාවට පත් වෙමින් ඇත.

විශ්ලේෂණ උදෙසා යොදා ගත හැකි දත්ත රැස් කිරීම සහ ඒවා ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ වගකීම දරන මූලිකම රාජ්‍ය ආයතනය වන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත දැක්ම වන්නේ 'රටෙහි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන සංඛ්‍යාන තොරතුරු ලබා දීමෙහි කලාපීය පුරෝගාමියා බවට පත් වීම' යන්නයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සිය දැක්ම යථාර්ථයක් බවට පත් කර ගැනීමට දක්වන කැපවීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව මෙම විදසුන මගින් පෙන්වා දෙයි. ඉන්දියාවෙහි සංඛ්‍යා දත්ත රැස් කිරීමේ ආරම්භය ඉතාම මෑතකාලීන එකක් වන අතරම එය අතිශයින් සංකීර්ණ දත්ත රැස් කිරීමේ සන්දර්භයක් සහිත රටක් වුවද, පොදු දත්ත ලබා ගැනීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම අතින් ශ්‍රී ලංකාව අත්කර ගැනීමට අපේක්ෂා කරන කලාපීය පුරෝගාමියාගේ භූමිකාවට පත් වෙමින් පෙරමුණ ගැනීමට ඉන්දියාව සමත් වී ඇති බව මෙම විශ්ලේෂණ මගින් තහවුරු කරයි.

ඉන්දියාව සමග සිදු කරනු ලැබ ඇති මෙම සන්සන්දනාත්මක විශ්ලේෂණය පැතිකඩ තුනක් මත පදනම් වේ: එනම් (1) දත්ත ලබා ගැනීමට ඇති පහසුව (2) දත්ත ලබා දෙන ඉක්මණ සහ (3) දත්ත ලබා ගැනීමට දැරිය යුතු පිරිවැයයි.

## කාලීන දත්ත සැමට ලබා ගත හැකි පරිදි පැවතීමේ වැදගත්කම

දත්ත වනාහි ඕනෑම රටක් සතු ඉතාම වැදගත් පොදු වත්කමකි. දත්ත ලබා ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීම හිතකර ප්‍රතිඵල රැසකට මග පාදයි. විද්වතුන්ට හා වෘත්තිකයන්ට වඩා හොඳ විශ්ලේෂණයන් සිදු කිරීමටත්, රජයට වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටත්, වඩා හොඳ ආර්ථික හා ආයෝජන තීන්දු ගැනීමට සහාය වීමටත් දත්ත උපකාරී වන අතරම, රජයේ ප්‍රතිපත්තිවල සැබෑ ප්‍රතිඵල හා ප්‍රගතිය පිළිබඳ සමාජයට වඩා හොඳ දැක්මක් ලබා දීමටද එය මහෝපකාරී වේ.

> **සවිස්තරාත්මක තොරතුරු හොඳින් අවබෝධ කර ගැනීම සහ "රටෙහි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා" වඩා හොඳ තීරණ ගැනීම උදෙසා (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු ප්‍රතිපත්තියෙහි සඳහන් පරිදි) සැපිරිය යුතු පළමු අවශ්‍යතාව වන්නේ සැබෑ දත්ත වෙත විවෘත ප්‍රවේශයක් පැවතීමයි.**

'දත්ත' යන වචනය බොහෝ විට යොදා ගැනෙනුයේ සාරාංශගත කරන ලද සමුච්චිත සංඛ්‍යාත තොරතුරු හැඳින්වීම සඳහා ය. මෙහි අප එම වචනය භාවිත කරනුයේ එකී සාරාංශගත කරන ලද සමුච්චිත සංඛ්‍යාත තොරතුරු සැකසීම සඳහා යොදා ගැනෙන සත්‍ය දත්ත හැඳින්වීමටය.

එවැනි සාරාංශගත සංඛ්‍යාත තොරතුරු පමණක් නොව පොදුවේ දත්ත ලබා ගැනීමට ඇති හැකියාව ඕනෑම රටක සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සඳහා අතිශයින් වැදගත් වේ. මෙයට නිදසුනක් ලෙස, වාර්ෂික ශ්‍රම බලකා සමීක්ෂණයේදී වාර්තා කෙරෙන රැකියා වියුක්ති අනුපාතය සඳහන් කළ හැක. මෙම ඇස්තමේන්තුව ලබා ගැනෙනුයේ මුළු නියැදිය තුළ රැකියා විරහිතභාවයෙන් පෙළෙන පුද්ගලයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගනිමිනි. ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය පිළිබඳ පුළුල් සර්ව දැක්මක් එමගින් ලබා දේ. එහෙත්, රැකියා වියුක්තියට අදාළ භූ ගෝලීය සාධක හා වයස් කාණ්ඩ බෙදී යාම, මෙන්ම රැකියා වියුක්තියට බලපාන වාර්ගිකත්වය, භාෂාව හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී අනෙකුත් ජනගහනය සම්බන්ධ වැදගත් තොරතුරු එවැනි සාරාංශගත දත්ත මගින් ලබා නොදේ.

වාර්තාකරණ ඒකකයේ රහස්‍යභාවය සුරැකෙන ආකාරයට නිර්නාමිකභාවය සහතික කරමින් තනි පුද්ගල, ගෘහ ඒකක හෝ ආයතන මට්ටමේ නිරීක්ෂණය ඒකක සහිත දත්ත ගොනු භාවිතා කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, අධ්‍යාපන මට්ටම, ආදායම හා පදිංචි දිස්ත්‍රික්ක ආදී පැතිකඩ සම්බන්ධයෙන් වැදගත් තොරතුරු ලබා දීමට හැකියාව තිබේ. දත්ත සහ විශ්ලේෂණ මත පදනම්ව වඩා හොඳ ඵලදායී හා කාලයක් පවතින ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා මගක් එවැනි දත්ත මගින් සැපයේ. මේ නිසා, සවිස්තරාත්මක තොරතුරු හොඳින් අවබෝධ කර ගැනීම සහ "රටෙහි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා" වඩා හොඳ තීරණ ගැනීම උදෙසා (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු ප්‍රතිපත්තියෙහි සඳහන් පරිදි) සැපිරිය යුතු පළමු අවශ්‍යතාව වන්නේ සැබෑ දත්ත වෙත විවෘත ප්‍රවේශයක් පැවතීමයි.

## දත්ත ලබා ගැනීමේ හැකියාව සම්බන්ධ පැතිකඩ තුන: ශ්‍රී ලංකාව ඉන්දියාවට පසුගාමී තත්වයක සිටී

ප්‍රතිපත්ති සම්පාදකයන් හා මහජනතාව යන පාර්ශව දෙකම වෙනුවෙන් තීන්දු ගැනීමේ ඵලදායී මෙවලමක් බවට දත්ත පත් කිරීම සඳහා දත්ත ලබා ගැනීමේ හැකියාව පැතිකඩ තුනක් භාවිතා කරමින් තක්සේරුවට ලක් කළ හැක: (1) පහසු ප්‍රවේශය (2) ලබා ගත හැකි ඉක්මණ සහ (3) පිරිවැය. එම පැතිකඩ තුන සළකා බැලූ කල ශ්‍රී ලංකාව ඉන්දියාවට වඩා පසුගාමී තත්වයක සිටින බව මෙම විශ්ලේෂණය මගින් පෙන්නුම් කරේ.

### 1. ලබා ගැනීමේ පහසුව : ශ්‍රී ලංකාව කිසිදු දත්ත ගොනුවක් අන්තර්ජාලය හරහා ලබා දීමට අසමත් වී ඇත

2014 ඔක්තොම්බර් මාසයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දත්ත ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. මහජනතාවට දත්ත ලබා ගැනීමට ඇති අවශ්‍යතාව ආමන්ත්‍රණය කෙරෙන මෙම ප්‍රතිපත්ති මගින් ඒ පිළිබඳ මාර්ගෝපදේශ මාලාවක් සැපයේ. 'පොදු' දත්ත ගොනු මහජනතාවගේ පරිහරණය උදෙසා ස්වකීය ජාතික දත්ත එකතුව හරහා ලබා ගත හැකි විය යුතු බවත්, එම දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ භාගත කර හැකි විය යුතු බවත් එහි සුවිශේෂ කොට දැක්වේ

කෙසේ වෙතත්, පසුගිය වසර හය හමාරකට වඩා වැඩි කාලය තුල තමන්ගේම දත්ත ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තිය යටතේ එකී ප්‍රමුඛ බැඳීම සාක්ෂාත් කරගැනීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමත් වී නොමැත. 2021 ජුනි මාසය වන විටත් ජාතික දත්ත එකතුව වෙතින් අන්තර්ජාලය ඔස්සේ දත්ත ගොනු කිසිවක් ලබා ගැනීමේ හැකියාවක් නොපවතී.මෙම 'පොදු' දත්ත ගොනු ලබා ගැනීම සඳහා අප පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රයත්න කිහිපයක්ම දරන ලද නමුදු ඉහත ප්‍රතිපත්තියෙහි සඳහන් පරිදි ඒවා භාගත කර ගැනීමට හැකි තත්වයක් නොමැති බව හඳුනා ගැනිණ.

මෙම තත්වය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින්ද සනාථ කරන ලදී.

**ඉන්දියාව ශ්‍රී ලංකාවට වඩා ඉදිරියෙනි:** ඉන්දියාව තුළ ජාතික මට්ටමේ දත්ත හා සංඛ්‍යාත තොරතුරු රැස් කිරීමේ කාර්යභාරය එරට සංඛ්‍යාලේඛන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය සහ ස්වදේශ කටයුතු අමාත්‍යංශය අතර බෙදා දක්වා ඇත. මේ අනුව කලින් කල ජාතික ආර්ථික සංඛ්‍යාලේඛන හා මහා පරිමාණ ජාතික නියැදි සමීක්ෂණ එරට සංඛ්‍යාලේඛන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය විසින් සිදු කරනු ලැබෙන අතර ස්වදේශ කටයුතු අමාත්‍යංශය අදාළ දස වාර්ෂික සංඛ්‍යාලේඛන සමීක්ෂණ ක්‍රියාත්මක කරයි.

පොදු දත්ත අන්තර්ජාලය හරහා ලබා ගැනීමට ඉඩකඩ සැලසීමද සඳහන් වන ඉන්දියාවේ පවතින දත්ත ව්‍යාප්තකරණ ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලද්දේ 2019 අප්‍රේල් මාසයේදී (ශ්‍රී ලංකාවට වඩා වසර පහකට පසුව) වීම විශේෂයකි. එසේකුදු වුවත්, ශ්‍රී ලංකාවට වඩා අතිශයින් වෙනස් තත්වයක් ප්‍රකට කරමින් ඉන්දියාව මේ වන විට සිය දත්ත ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්ති පූර්ණ වශයෙන් මෙහෙයුම්ගත කිරීමට සමත් වී ඇත. ඉන්දියාව තුළ මෙන්ම ඉන් පරිබාහිරවද වාසය කරන රාජ්‍ය හා පෞද්ගලික දෙපර්ශ්වයේම පරිශීලකයන්ට එරට ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ වෙබ් අඩවියෙහි පළ කර ඇති ජාතික දත්ත ගබඩාව ඔස්සේ පොදු දත්ත ගොනු භාගත කරගත හැක. එම දත්ත ගොනු වෙත ප්‍රවේශ වීම හා ඒවා භාගත කර ගැනීම සිදු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ පියවර සහිත මගපෙන්වීමක් එම වෙබ් අඩවිය සතු වේ. එම දත්ත භාගත කර ගෙන දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගැනෙන නොමිලේ භාවිත කළ හැකි මෘදුකාංගයක් වන Nesstar මගින් පරිශීලනය කිරීම හෝ STATA ආදී වෙනත් මෘදුකාංග වෙත ලබා ගැනීමට මෙන්ම මයික්‍රොසොෆ්ට් එක්සෙල් මාදිලියට එම දත්ත ගොනු හැරවීමටද අවකාශ සලසා ඇත.

### 2. ලබා ගැනීමේ ඉක්මණ : ශ්‍රී ලංකාව සතු වන්නේ ඉතා දීර්ඝ ක්‍රියාවලියකි

පොදු දත්ත ගොනු කිසිවක් අන්තර්ජාලය හරහා ලබා නොදීමට අමතරව, එම දත්ත අන්තර්ජාලයෙන් පරිබාහිරව ලබා දීම සම්බන්ධයෙන් තමන් විසින් දක්වා ඇති කාල රාමුවලට අනුගත වීමටද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අසමත් වී ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තියට අනුව, නිශ්චිත දත්ත ගොනු ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ලැබුණු පසුව එම ඉල්ලීම සති දෙකක් ඇතුලත ඇගයීමට ලක් කොට එය අනුමත කරනු ලැබෙන්නේ නම් ගෙවීම සිදු කිරීමෙන් අනතුරුව එම දත්ත ගොනු ලබා දීමට කටයුතු කළ යුතු වේ.

වෙරිටේ රිසර්ච් ආයතනය විසින් අධ්‍යයනය කරන ලද සිද්ධි අධ්‍යයන දෙකක් දත්ත


ලබා ගැනීමේ ඉක්මන සම්බන්ධයෙන් ඉතා වැදගත් විය. දත්ත ගොනු ලබා දීම සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සිය ප්‍රතිපත්තියෙහි දක්වා ඇති කාල රාමුවලට අනුව කටයුතු කිරීමට සමත් නොවන බව එම සිද්ධි අධ්‍යයන මගින් පෙන්නුම් කෙරිණ. මේ අතරින් පළමු සිද්ධි අධ්‍යයනය, 2011 වසරේදී මෙරට ජනගහනය හා නිවාස ව්‍යාප්තිය සම්බන්ධයෙන් 5% ක නියැදියක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලීමකට සම්බන්ධ වන්නකි. මෙම දත්ත ලැබීමට පෙර ආසන්න වශයෙන් වසර එක හමාරක කාලයක් මුළුල්ලේ අප පර්යේෂණ කණ්ඩායමට විවිධ පසු විපරම් ප්‍රයත්න රැසක් දරන්නට සිදු විය. ඊට අදාළ පළමු ඉල්ලීම 2017 දෙසැම්බර් 12 දින සිදු කරන ලද අතර දත්ත කාණ්ඩය ලබා ගැනීමට හැකි වුයේ 2017 ජුනි 01 දින ය. 2012 හා 2016 වසරවලට අදාළ ශ්‍රම බලකා සමීක්ෂණය හා ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය අදායම් හා වියදම් සමීක්ෂණ ලබා ගැනීමට සඳහා ඉල්ලීම් සිදු කළ දෙවන සිද්ධි අධ්‍යයනයට අදාළවද පසු විපරම් කිහිපයක්ම සිදු කරන්නට සිදු වූ අතර, දත්ත ලබා ගත හැකි වුයේ මාස දෙකක පමණ කාලයකින් අනතුරුව ය (1 ප්‍රදර්ශිතය බලන්න)

**ඉන්දියාව ශ්‍රී ලංකාවට වඩා ඉදිරියෙනි:** දත්ත වෙත අන්තර්ජාලය ඔස්සේ භාගත කර ගැනීමට අවකාශය ඉන්දියාව විසින් සලසා ඇති නිසා එම දත්ත ලබා ගැනීමට ගත වන කාලය ශ්‍රී ලංකාවේදී මෙන් මාස ගණනාවක් (ඇතැම් විට වසරකටත් අධික කාලයක්) නොව පැය කිහිපයක් වීම කැපී පෙනේ.

## 3. ලබා ගැනීමට දැරිය යුතු පිරිවැය: ශ්‍රී ලංකාව දත්ත ගොනු බොහොමයක්ම ලබා දීම සඳහා ගාස්තුවක් අය කළද ඉන්දියාව එම දත්ත නොමිලේ ලබා දෙයි

පහසුවෙන් හා ඉක්මණින් දත්ත ලබා ගැනීමේ අවස්ථා නොමැති වීමට අමතරව ශ්‍රී ලංකාව තුළ පොදු දත්ත ලබා ගැනීමේදී මුහුණ දෙන්නට වන තවත් බාධකයක් නම් පිරිවැයයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන හා උසස් අධ්‍යාපනයේ නිරත වන සිසුන් හැරුණු කොට අන් සියලුම දත්ත පරිශීලකයන්ට එම දත්ත ලබා ගැනීම සඳහා ගාස්තුවක් ගෙවන්නට සිදු වේ. කිලෝබයිට් 50 ක විශාලත්වයකින් යුතු දත්ත ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා දේශීය පුද්ගලයන්ට රු. 100 ක සම්මත ගාස්තුවක් ගෙවීමට සිදු වේ. මෙම දත්ත ගොනු බෙහෙවින් විශාල වන හෙයින් ඒ සඳහා ගත වන සම්පූර්ණ පිරිවැය අධික විය හැක. නිදසුනක් ලෙස 2019 සිදු කරන ලද පළමු සිද්ධි අධ්‍යයනයේදී 2012 වසරට අදාළ ජනගහන හා නිවාස ව්‍යාප්ති සංඛ්‍යාලේඛනවලින් සියයට 5 ක නියැදියක් ලබා ගැනීම සඳහා රු. 427,406 ක පිරිවැයක් දරන්නට සිදු විය.

**1 ප්‍රදර්ශිතය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දත්ත ඉල්ලුම් කිරීමට ඇති ක්‍රමවේදය අනුගමනය කරමින් දත්ත ලබා ගැනීමට වෙරිටේ රිසර්ච් ආයතනයට ගත වූ කාලය**




එමෙන්ම, නියම කර ඇති ගාස්තුද ඉහත සඳහන් ප්‍රතිපත්තියට අනුගත නොවේ. දත්ත රැස් කරනු ලබන්නේ මහජනතාවගේ මුදල් යොදා ගනිමිනි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තියෙහි සඳහන් වන්නේ එම මිල නියම කර ඇත්තේ "ක්ෂුද්‍ර දත්ත ලබා දීමේ පිරිවැය ආවරණය කර ගැනීමට මිස දත්ත රැස් කිරීමේ පිරිවැයද ඇතුළත් සියලු කාර්යයන්හි පිරිවැය ආවරණය කිරීමේ අරමුණින් නොවන" බවකි. මේ නිසා, ඉල්ලුම් කරන පාර්ශ්වය වෙත අදාළ දත්ත ලබා දීම සඳහා වූ ස්ථාවර ගනුදෙනු පිරිවැයට අමතරව, අමතර දත්ත ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා වූ ආන්තික පිරිවැය බින්දුවට සමීප විය යුතු ය. මේ නිසා ස්ථාවර ගනුදෙනු/ලබා දීමේ පිරිවැයක් වෙනුවට සෑම කිලෝබයිට් 50 ක දත්ත ඒකකයක් සඳහාම රු. 100 ක ගාස්තුවක් අය කිරීමේ රේඛීය මිලකරණ ක්‍රමවේදය ඉහත කී ප්‍රතිපත්තියෙහි දක්වා ඇති මිලකරණ මූලධර්මයට අනුකූල නොවේ.

දත්ත ලබා දීමේ ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ 'පරිශීලකයන්ට පහසුවෙන් හා දරාගත හැකි මිලකට දත්ත ගොනු ලබා ගැනීමට අවස්ථාව ලබා දීම තුළින් ඒවායෙහි පුළුල් පරිභෝජනය දිරිමත් කිරීමේ අරමුණින් වන බව එකී ප්‍රතිපත්තියෙහි සඳහන් වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙතින් තෝරාගත් දත්ත සඳහන් ලබා ගැනීමට වෙරිටේ රිසර්ච් ආයතනයට දරන්න සිදු වූ රුපියල් තිස් දහසේ සිට ලක්ෂණ තුන හමාරක් දක්වා වූ සැබෑ පිරිවැය දෙවෙනි ප්‍රදර්ශය මගින් දැක්වේ. විශාල පරිමාණයේ දත්ත ගොනුවලින් හුදෙක්ම සියයට 5 ක් වැනි ප්‍රමාණයක් සඳහා ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල අදායමෙන් අඩක්ම ඉක්මවා යන ඉහත කී මිල ගණන් එකී දත්ත පරිශීලනය කිරීමට

**2 ප්‍රදර්ශිතය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙතින් දත්ත ගොනු ලබා ගැනීම සඳහා වැය වූ සැබෑ පිරිවැය**

| දත්ත; ගොනු | විශාලත්වය (කි.බ වලින්) | දරන්නට සිදු වූ සැබෑ පිරිවැය (ශ්‍රී ලංකා රුපියල්වලින්) |
|---|---|---|
| 2012 ශ්‍රම බලකා සමීක්ෂණය | 16,907 | 33,800 |
| 2016 ශ්‍රම බලකා සමීක්ෂණය | 22,222 | 44,400 |
| 2012 ගෘහ ඒකක අදායම් හා වියදම් සමීක්ෂණය | 121,789 | 243,500 |
| 2016 ගෘහ ඒකක අදායම් හා වියදම් සමීක්ෂණය | 73,503 | 147,000 |
| 2001 මෙරට ජන සහ නිවස සංගණනයේ 5% ක නියැදියක් ලබා ගැනීම | 226,787 | 453,574 |
| 2012 මෙරට ජන සහ නිවස සංගණනයේ 5% ක නියැදියක් ලබා ගැනීම | 213,703 | 427,406 |

**ඉන්දියාවේ පවතින දත්ත ව්‍යාප්තකරණ ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලද්දේ ශ්‍රී ලංකාවට වඩා වසර පහකට පසුව වීම විශේෂයකි. එනෙකුදු වුවත්, ශ්‍රී ලංකාවට වඩා අතිශයින් වෙනස් තත්වයකට ප්‍රකට කරමින් ඉන්දියාව මේ වන විට සිය දත්ත ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්ති පූර්ණ වශයෙන් මෙහෙයුම්ගත කිරීමට සමත් වී ඇත.**

**නිදසුනක් ලෙස 2019 සිදු කරන ලද පළමු සිද්ධි අධ්‍යයනයේදී 2012 වසරට අදාළ ජනගහන හා නිවාස ව්‍යාප්ති සංඛ්‍යාලේඛනවලින් සියයට 5 ක නියැදියක් ලබා ගැනීම සඳහා රු. 427,406 ක පිරිවැයක් දරන්නට සිදු විය.**

බොහෝ පුද්ගලයන් ධෛර්යමත් කරනවා වෙනුවට අධෛර්යමත් කිරීමට වැඩි ඉඩක් ඇත. මේ නිසා, එම මිල ගණන් ඉහත කී ප්‍රතිපත්තියෙහි දැක්වෙන කාරණාවලට වඩා දෙයාකාරයකින් පරස්පර වේ. එය දත්ත "සැපයීමේ ගනුදෙනු පිරිවැයට" පමණක් සීමා නොවන අතරම පරිශීලනය අධෛර්යමත් කරන තරමේ ඉහල පිරිවැයකින් යුතුය.

**ඉන්දියාව ශ්‍රී ලංකාවට වඩා ඉදිරියෙනි:**
ඉන්දියාව සම්බන්ධයෙන් බැලූ කල, දත්ත ගොනු නොමිලේ ලබා ගත හැකි තත්වයක් පවතී. ඉන්දියානු රජය විසින් සිය නිල සංඛ්‍යාලේඛන පොදු වත්කමක් ලෙස පිළිගෙන ඇති අතර, පර්යේෂණ සිදු කිරීම මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අරමුණුද වෙනුවෙන් එකම ස්ථානයක අන්තර්ජාල ප්‍රවේශයක් ඔස්සේ සියලුම දත්ත ගොනු නොමිලේ ලබා දිය යුතු බවට නිශ්චය කරමින් 2019 අප්‍රේල් මාසයේදී නිල නිවේදනයක් නිකුත් කරන ලදී.

දත්ත සම්බන්ධයෙන් ගත් විට ඉන්දියාව ශ්‍රී ලංකාවට ආදර්ශයක් සපයමින් බෙහෙවින් ඉදිරියට ගොස් ඇත

දත්ත ලබා දීම අතින් ඉන්දියාව විසින් ප්‍රගතිශීලී පියවර රැසක් අනුගමනය කරනු ලැබ ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්ද ඉතා කඩිනමින් කටයුතු කර ඇත. එහෙත් ශ්‍රී ලංකාව ඒ සම්බන්ධයෙන් ප්‍රතිශීලීභාවය අතින් අඩු ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර ඒවා වුවද ක්‍රියාත්මක කිරීමේදී පසුගාමී තත්වයක සිටී

ඉන්දියාව නිලතන්ත්‍රීය ප්‍රතිපත්තිය තුළ පහත කරුණු අඩංගු වේ (දත්ත වෙත නොමිලේ අන්තර්ජාල ප්‍රවේශය ලබා දීම පිළිබඳ ඉන්දීය රජයේ සංඛ්‍යාලේඛන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති නිල නිවේදනයෙහි සඳහන් පරිදි):

*"නිල සංඛ්‍යාලේඛන වනාහි තීරණ ගැනීම හා ප්‍රතිපත්තිමය මැදහත්වීම සඳහා වූ ප්‍රධානතම ආදානයන් වන අතර රාජ්‍ය හා පෞද්ගලික යන අවකාශ දෙක තුළම පර්යේෂණ සිදු කිරීම සඳහා පොදු වත්කම් බවට පත් වේ. මේ අනුව, දත්ත සතු එකී භව්‍යතාව පිළිගනිමින් ඉන්දීය රජයේ සංඛ්‍යාලේඛන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය විසින් සිදු කරනු ලබන සංඛ්‍යාලේඛන හා සමීක්ෂණයන්ට අදාළ ක්ෂුද්‍ර දත්ත වෙත එකම ස්ථානයකින් නොමිලේ ප්‍රවේශ වීමේ අවස්ථාව ලබා දීමට තීරණය කර තිබේ..."*

ශ්‍රී ලංකා රජය විසින්ම ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ නිසි කලට සංඛ්‍යාන තොරතුරු ලබා දීම අතින් කලපීය පුරෝගාමියෙකු බවට පත් වීමේ රජය සතු අභිලාෂයන්ට සාපේක්ෂව මෙම විදසුන මගින් මෙරට කාර්යසාධනය තක්සේරු කරනු ලැබේ. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට සාපේක්ෂව සිදු කරන ලද මෙම තක්සේරුව මගින් පෙනී යන්නේ ශ්‍රී ලංකාව ස්වකීය ප්‍රතිපත්තිවල දක්වා ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට දැනට අසමත් වන බවකි. පොදු පරිශීලකයන් සඳහා දත්ත ලබා දීමේ වැදගත්කම ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල් දෙකම පිළිගන්නා නමුදු, ඉන්දියාව හා සංසන්දනය කිරීමේදී පෙනී යන්නේ එරට ශ්‍රී ලංකාවට වඩා ප්‍රගතිශීලී ප්‍රතිපත්ති වෙත අවතීර්ණ වී ඇති බවත්, එකී ප්‍රතිපත්ති වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම තුලින් දත්ත ලබා ගැනීමට ඇති පහසුව, ඉක්මණ ඉහල නැංවීමට හා පිරිවැය පහළ දැමීමට සමත් වී ඇති බවත්ය.◆